# දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020

**** විශේෂයෙන් සැලකිය යුතුයි ****

**මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අනිවාර්යයෙන්ම ලියාපදිංචි වී අයදුම් කළ යුතුය.**

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ). සිංහල/ දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මගින් ලබා ගත හැකිය. අන්තර්ජාලය හරහා අනිවාර්යයෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, A4 (සෙ.මී.21X29) ප්‍රමාණයේ කඩදසි භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දෘඩ පිටපතක් (Hard Copy) අපේක්ෂකයින් විසින් 2020.10.09 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනයට යොමු කරන්න.

**ලේකම්,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල.**

**කේ.එල්. දයානන්ද,**
**ලේකම්.**

**වැඩිදුර තොරතුරු සඳහා විමසන්න - 091-2248450**